අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 32/2017

මගේ අංකය:- ඊඩී/04/59/03/07

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉසුරුපාය

බත්තරමුල්ල.

2017. ~~08.~~ 10. 6

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු

සියළුම පීඨාධිපතිවරු

**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නව සේවා ව්‍යවස්ථාව යටතේ කාර්යක්ෂමතා කඩඉම් හා සන්ධාන භාෂා පරීක්ෂණ සම්පූර්ණ කිරීම.</u>**

අංක 1925/37 හා 2015.07.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පල කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නව සේවා ව්‍යවස්ථාවේ 8.1(1) හා 9.1(3) වගන්ති වලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත තීරණ ලබා දී ඇති බව දන්වමි.

02. ඒ අනුව පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමි.

I. නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2015.07.28 දිනට වසර 3ක පරිවාස කාලය සහ සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇති එනම්, 2012.07.28 දිනට පෙර බඳවාගත් නිලධාරීන් II ශ්‍රේණියට උසස්වීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ සඳහන් **ඉංග්‍රීසි භාෂාව** හැර අනෙකුත් සියලුම විෂයන් සමත් විය යුතුය.

II. නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2015.07.28 දිනට වසර 3ක පරිවාස කාලය හෝ සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර නොමැති නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාව යටතේ වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ සඳහන් සියලුම විෂයන් (**ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් හතරම**) සමත් විය යුතුය.

III. පැරණි සේවා ව්‍යවස්ථාවේ 17 වගන්තිය යටතේ දක්වා ඇති ඉංග්‍රීසි භාෂා සුදුසුකම සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 9.1(3) වගන්තියේ සඳහන් සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සලකනු ලැබේ. එම නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ 10.1.1(vii) යටතේ දක්වා ඇති සුදුසුකම සම්පූර්ණ කර ඇති නිලධාරීන් ලෙස සලකනු ලැබේ.

IV. පැරණි සේවා ව්‍යවස්ථාවේ 17 වගන්තිය යටතේ දක්වා ඇති ඉංග්‍රීසි භාෂා සුදුසුකම සම්පූර්ණ කර නොමැති නිලධාරීන් II ශ්‍රේණියට උසස්වීමට පෙර නව සේවා ව්‍යවස්ථාවේ 9.1(3) වගන්තියේ සඳහන් සන්ධාන භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කලයුතුය.

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව නිකුත් කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත:- ලේකම් - රාජ්‍ය සේවා කොමිෂන් සභාව - ඔබේ අංක PSC/ESC/02-03/04/2017 හා 2017.06.09 දිනැති ලිපිය අනුව -කරු.දැ.ග.ස.